# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 33 දරන තේ පර්යේෂණ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 1 වන දින]

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 ඔක්තෝබර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 33 දරන
තේ පර්යේෂණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 1 වන දින]

එල්.ඩී.—ඔ. 45/74

තේ පර්යේෂණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 33 දරන තේ පර්යේෂණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1961 අංක 57 දරන පනතින් සංශෝධිත තේ පර්යේෂණ ආඥාපනතේ 11 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 438 වන අධිකාරයේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "(1) මණ්ඩලයට වාර්ෂික ආදායමක් ලැබීමට සැලැස්වීමේ කාර්යය සඳහා, රේගු ආඥාපනත යටතේ අය කරනු ලබන අපනයන තීරු බද්දට අමතරව, අපනයනය කරනු ලබන තේ රාත්තල් සියයකට රුපියලකුත් සත පනහ බැගින් වූ සහ ඒ අනුව ඊට අඩු බර ප්‍රමාණයක් වෙනුවෙන් සමානුපාතික වූ අපනයන තීරු බද්දක් නියම කොට අය කළ යුතු අතර එය ගෙවිය යුතු ය. එම බද්දෙන් ලැබෙන මුදල් වලින් කිසිම කොටසක් ඒකාබද්ධ අරමුදලට බැර නොකොට ප්‍රධාන රේගු අයකැමි විසින් මාස්පතා මණ්ඩලයට ගෙවිය යුතු ය.".

ජ 09431—8550 (74/09)

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.